SAVINGS

AIA EDUCATION PLAN

# ඔබේ දරුවා දියුණුවේ හිණි පෙත්තට රැගෙන යන අධ්‍යාපන සැලසුමක්



HEALTHIER, LONGER, BETTER LIVES

aialife.com.lk



වර්තමාන තරඟකාරී ලෝකය තුළ සියල්ල තීරණය වනුයේ අධ්‍යාපනය මතය. උසස් පෙළ විභාගය සම්පූර්ණ කරන සිසුන් අතුරින් දේශීය විශ්ව විද්‍යාල වලට පිවිසීමේ වරම් හිමිවන්නෙ ඉතා සුළු ප්‍රමාණයකට වන අතර දේශීය පෞද්ගලික උසස් අධ්‍යාපන කටයුතු සඳහා ඉතා අධික මුදලක් වැය වේ. විදේශීය විශ්වවිද්‍යාල තුළින් අධ්‍යාපනය ලැබීම සඳහා ද එයටත් වඩා අධික මුදලක් ජීවන වියදම්වලට අමතරව ඔබට වැයවනු ඇත.

දැනට පවතින ඉහළ ණය පොළී අනුපාත අනුව ණය මුදලක් ඔස්සේ ඔබේ දරුවාගේ අධ්‍යාපනය සඳහා මුදල් සම්පාදනය කරගතහොත්, අදාළ ණය මුදලට සාපේක්ෂව අධික මුදලක් ගෙවීමට ඔබට සිදුවනු ඇත. මෙමගින් ඇති විය හැකි ආර්ථික අපහසුතාවය ඔබ සහ ඔබේ ආදරණීයයන්ගේ සිතේ සැනසුම කෙරෙහි අහිතකර අයුරින් බලපෑ හැක. අවිනිශ්චිතභාවය නිසාවෙන් සම්ප්‍රදායික ක්‍රම හරහා සිදුකරනු ලබන ඉතුරුම්ද ඵලදායී නොවිය හැක. ඔබේ වියෝවේදී ඔබගේ සම්ප්‍රදායික ඉතුරුම් එලෙසින්ම පවතිනු ඇත. නමුත් එම ඉතුරුම්වල ශේෂය ඔබේ දරුවාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීමට ඉඩ ඇත.

නමුත් ඔබගේ දරුවාගේ උසස් අධ්‍යාපන සැලසුම් සඳහා මුදල් සම්පාදනය කරගත හැකි අයුරින් සකසන ලද ජීවිත රක්ෂණ සැලසුමක් ඔබ සතු වීනම් තත්ත්වය කෙසේ විය හැකිද? දැන් AIA EducationPlan සමඟින් ඔබේ දරුවා හට දීප්තිමත් අනාගතයක් සඳහා දොරටු විවර වී ඇත.

## මෙම සැලසුම ඔබට වඩාත්ම සුදුසු රක්‍ෂණ විසඳුමද?

- ඔබේ සිහිනය ඔබේ දරුවාට ජාත්‍යන්තර තත්ත්වයේ අධ්‍යාපනයක් ලබාදීමටද?
- ඔබ ජීවත්ව නොසිටියද, ඔබගේ දරුවාට ජාත්‍යන්තර තත්ත්වයේ අධ්‍යාපනයක් සුරක්ෂිත කරදීමට ඔබට අවශ්‍යද?
- ඔබ ජීවත්ව නොසිටියද, ඔබගේ පවුලේ ජීවන තත්ත්වය එලෙසින්ම රැකගැනීමට ඔබට අවශ්‍යද?
- ඔබ සෞඛ්‍ය සහ අනෙකුත් රැකවරණ ප්‍රතිලාභ බලාපොරොත්තු වන්නේද?

## AIA EducationPlan මගින් ඔබ වෙත ලබාදෙන ප්‍රතිලාභ මොනවාද?

### ඔබ ජීවත්ව නොසිටියත් ඔබේ දරුවා වෙත අධ්‍යාපන අරමුදලක්

අපගේ සැලසුම යටතේ රක්‍ෂණ සැලසුම් කාලසීමාව තුළදී ඔබ මිය ගියහොත් හෝ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකට පත්වුවහොත් අප විසින් ඔබ වෙනුවෙන් ඔබගේ වාරික ගෙවීම අඛණ්ඩව සිදුකෙරෙනු ඇත. ඒ ඔස්සේ ඔබ ජීවත්ව නොසිටියද ඔබ විසින් සැලසුම් කරන ලද අධ්‍යාපන අරමුදල ඔබගේ දරුවා වෙත හිමි වනු ඇත.

### ඔබ ජීවත්ව නොසිටියද ඔබේ පවුලේ ජීවන තත්ත්වය එලෙසින්ම සුරක්ෂිත කෙරේ

අපගේ සැලසුම යටතේ රක්‍ෂණ සැලසුම් කාලසීමාව තුළදී ඔබ මිය ගියද ඔබගේ ආදරණීයයන් හට සිය ජීවන තත්ත්වය එලෙසින්ම පවත්වාගෙන යාම සඳහා එකවර මුදල් ගෙවීමක් සිදුකරනු ඇත.

### ඔබේ දරුවා හට ඔහුගේ/ඇයගේ සිහින සැබෑකරගැනීම සඳහා අධ්‍යාපන අරමුදලක්

අපගේ විශේෂිත ලාභාංශ ක්‍රමය යටතේ ඔබගේ අරමුදල අඛණ්ඩව වර්ධනය වන බැවින් සැලසුම කල්පිරීමේදී සැලකිය යුතු අධ්‍යාපන අරමුදලක් හිමිවනු ඇත.

### ඔබටම ගැළපෙන ජීවිතාවරණයක්

AIA EducationPlan මගින් ඔබගේ අවශ්‍යතාවයට අනුව ඔබටම සරිලන ජීවිතාවරණයක් සකස්කර ගත හැක.

### Loyalty දීමනාව

10 වැනි සැලසුම් සංවත්සරයේදී ඔබ වෙත ඔබගේ වාර්ෂික මූලික වාරිකය මෙන් 400% දක්වා Loyalty දීමනාව හිමිවනු ඇත. මෙම දීමනාව හිමිකර ගැනීමටනම්, ඔබ විසින් එම වසර 10 තුළ අදාළ වාරික ගෙවීමට නියමිත දිනයේ සිට දින 180ක් තුළ සියලු වාරික ගෙවීම් අඛණ්ඩව සිදු කළ යුතු වේ. ඔබගේ වාරික ගෙවීම් මාදිලිය අනුව (එනම්, අර්ධ වාර්ෂික, ත්‍රෛමාසික හෝ මාසික යනාදී වශයෙන්) Loyalty දීමනාව වෙනස් වනු ඇත.

# ඔබගේ අරමුදල වර්ධනය වන්නේ කෙසේද?

AIA EducationPlan සමග පිරිනැමෙන සුවිශේෂී ලාභාංශ ක්‍රමය තුළින් ඔබගේ අරමුදලේ අගය නිතිපතා ඉහළ නංවයි. මෙහිදී ඔබේ අරමුදල වර්ධනය වන්නේ එම වසරට අදාළ සහතික කළ ලාභාංශ අනුපාතය (ගාස්තු අඩු කිරීමෙන් පසු) හෝ ප්‍රකාශිත ලාභාංශ අනුපාතය (ගාස්තු අඩු කිරීමෙන් පසු) යන දෙකෙන් වැඩි අගයෙනි.

ගෙවනු ලබන මූලික වාරික සහ අමතර වාරික (Top up) වෙන්කිරීමේ ගාස්තුවට ගැලපීමෙන් පසු රක්ෂණවරහිමියාගේ අදාළ ආයෝජන ගිණුමට බැර කෙරෙන අතර, ආයෝජන ගිණුමේ ඇති මුදල අදාළ ලාභාංශ ප්‍රතිශතයන් යටතේ වැල්පොලී ක්‍රමයට වර්ධනය වනු ඇත. මෙම ආයෝජන ගිණුමෙන් අදාළ ගාස්තු අඩු කරනු ලැබේ.

# නිදර්ශනය

ඔබේ වයස අවුරුදු 30ක්නම්, 2017 දී AIA EducationPlan සැලසුමක් රුපියල් 50,000ක වාර්ෂික මූලික වාරිකයකට සහ ජීවිතාවරණය වාර්ෂික මූලික වාරිකය මෙන් 15 ගුණයක් වන සේ ලබාගත්තේනම් අවුරුදු 15කට පසු ඔබගේ කල්පිරීමේ ප්‍රතිලාභය, ජීවිතාරක්ෂණ ප්‍රතිලාභ සහ මුළු වාර්ෂික වාරිකය පිළිබඳ නිදර්ශනය පහත දැක්වේ.

| මූලික වාර්ෂික වාරිකය | ප්‍රක්ෂේපිත ඉතුරුම් අරමුදල | | |
|---|---|---|---|
| | වාර්ෂිකව 4% | වාර්ෂිකව 8% | වාර්ෂිකව 12% |
| 50,000 | 1,085,130 | 1,447,232 | 1,947,324 |

අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි

වගුවෙහි සඳහන් කල්පිරීමේ ප්‍රතිලාභයන් 4%, 8% සහ 12% යන උපකල්පිත ලාභාංශ අනුපාතයන් යොදාගනිමින් ගණනය කරනු ලැබ ඇති අතර, සැලසුමට අදාළ වන ගාස්තු අඩුකිරීමෙන් පසු සහ සියලුම වාරික නිසි ආකාරයෙන් නියමිත අවස්ථාවන්වලදී ගෙවා ඇති බවට උපකල්පනය කෙරිණි.

මෙම උපකල්පිත ලාභාංශ අනුපාතයන් සහතික නොකෙරෙන අතර මෙය ඔබ වෙත හිමි විය හැකි ඉහළම හෝ පහළම අගයන්ද නොවේ.

කල්පිරීමේදී සැලසුමෙහි වටිනාකම ආයෝජන ගිණුමෙහි වටිනාකම වේ.

| සැලසුමෙහි අන්තර්ගත ප්‍රතිලාභ | මුදල |
|---|---|
| මරණ ප්‍රතිලාභය<br>(මූලික රක්ෂිත මුදල+අමතර ජීවිතාවරණ ප්‍රතිලාභය) | රුපියල් 750,000 |
| **වාරික ආරක්ෂණ ප්‍රතිලාභය**<br>මරණයකදී හෝ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී, ඉදිරි වාර මුදල් තැන්පත් කිරීමේ වගකීමෙන් නිදහස් වේ. එහෙත් පොරොන්දු වූ ප්‍රතිලාභ ඒ අයුරින්ම දිගටම ක්‍රියාත්මක වේ. | |

මූලික රක්ෂිත මුදලට අදාළ ආවරණ ලබාදීමට සහ කල්පිරීමේ ප්‍රතිලාභය ගොඩනැගීමට මූලික වාරිකය යොදා ගැනෙනු ඇත. අතිරේක ජීවිතාවරණ ප්‍රතිලාභය සහ වාරික ආරක්ෂණ ප්‍රතිලාභය සඳහා අතිරේක වාරිකයක් අය කෙරෙනු ඇත. එබැවින් ඉහත නිදර්ශිත ප්‍රතිලාභ සඳහා ගෙවිය යුතු මුළු වාර්ෂික වාරිකය ශ්‍රී ලංකා රුපියල් 61,926ක් වනු ඇත.

## සැලසුම සම්බන්ධ වෙනත් තොරතුරු

ඇතුළත්වීමේ වයසඃ අවුරුදු 19 - 61 (ඊළඟ උපන් දිනට)
උපරිම කල්පිරීමේ වයසඃ අවුරුදු 75
සැලසුම් කාලසීමාවඃ අවුරුදු 10 - 56
අවම ජීවිතාවරණයඃ රුපියල් 300,000

**අදාළ ගාස්තු**

**වෙන්කිරීමේ ගාස්තුවඃ**

| සැලසුම් වසර | 1 සැලසුම් වසර | 2 සැලසුම් වසර | 3 වැනි සැලසුම් වසරේ සිට |
|---|---|---|---|
| මූලික වාරිකය මත | 80% | 45% | 0% |
| අමතර වාරික (Top up) මත | 4% (සෑම අමතර වාරිකයක් මත) | | |

**පවාරණ ගාස්තුව**

| සැලසුම් වසර | 1 සැලසුම් වසර | 2 සැලසුම් වසර | 3 සැලසුම් වසර | 4වන සැලසුම් වසරේ සිට |
|---|---|---|---|---|
| පවාරණ ගාස්තුව | 100% | | | 75% සිට 0%* |

* සැලසුම් කාලසීමාව තුළ ක්‍රම ක්‍රමයෙන් පහළ යයි.

**පරිපාලන ගාස්තුව**

2017 සඳහා වසරකට රුපියල් 262.35ක් වන අතර සෑම ජනවාරි පළමුවැනි දිනකදීම වාර්ෂිකව 15% බැගින් ඉහළ යයි.

**අරමුදල් කළමනාකරණ ගාස්තුව**

ආයෝජන ගිණුමෙන් වාර්ෂිකව 0.75% කි.

**මර්ත්‍යතා ගාස්තුව**

සමාගම විසින් මූලික රක්ෂිත මුදල ලබා දීම සඳහා වන වියදමට අදාළ අයකිරීම් මත පදනම් වේ.

**මාදිලි ගාස්තුව**

මාසික වාරික මාදිලිය, මූලික වාරිකයෙන් 4% කි.

# ඔබ කළ යුත්තේ කුමක්ද?

ප්‍රතිලාභ භුක්ති විඳීම සඳහා රක්ෂණ සැලසුමෙහි වාරික ගෙවීමේ කාලසීමාව පුරා නියමිත වෙලාවට වාරික ගෙවීම් කළ යුතුය. පළමු සැලසුම් වසර තුන ඇතුළත ඔබ විසින් ඔබගේ වාරික, දින 30ක සහන කාල සීමාව තුළ නියමිත පරිදි ගෙවනු නොලැබූ විටකදී, සැලසුම බල රහිත වන අතර, ඔබ වෙත කිසිදු ප්‍රතිලාභයක් හිමි නොවනු ඇත. කෙසේ වුවද කොන්දේසිවලට යටත්ව සැලසුම නැවත බලගැන්වීමේ අවස්ථාව ඔබට හිමි වේ.

ඔබ විසින් ඔබගේ සැලසුම වසර 3ක් හෝ ඊට වැඩි කාලයක් පවත්වාගෙන යනු ලැබුවේනම්, නියමිත දිනට වාරික ගෙවීම ඔබට අතපසු වුවද, සමාගම මගින් ඔබේ ආයෝජන අරමුදලෙන් සැලසුම් පරිපාලන ගාස්තු, අරමුදල් කළමණාකරණ ගාස්තු, මූලික රක්ෂිත මුදල සඳහා මර්තයතා ගාස්තුව, අන්තර්ගත ප්‍රතිලාභ සඳහා සහ වෙනත් තෝරාගත් අමතර ප්‍රතිලාභ සඳහා ගාස්තු අයකොට බාධාවකින් තොරව ඔබ වෙත රැකවරණ ප්‍රතිලාභ ලබාදෙනු ඇත. එම නිසා, ආයෝජන අරමුදලෙහි ප්‍රමාණවත් ශේෂයක් පවතීනම්, ආර්ථික අසීරුතාවයන්හිදී පවා රැකවරණ ප්‍රතිලාභ ලබාගැනීමට ඔබට හැකිවනු ඇත. ශේෂය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ආයෝජන අරමුදලෙන් ඉහත සඳහන් කරන ලද ගාස්තු සහ වාරික අයකරගත නොහැකි වුවහොත් සැලසුම බල රහිත වනු ඇත. කෙසේ වුවද, ඔබගේ අරමුදලෙහි අඛණ්ඩ වර්ධනය තහවුරු කිරීම සඳහා නියමිත කලට වාරික ගෙවීම වැදගත් වේ. ඒ ඔස්සේ ඔබගේ සිහින සැබෑකරගෙන අවශ්‍යතා ඉටුකරගනිමින් රැකවරණ ප්‍රතිලාභ අත්විඳීමේ අවස්ථාව ඔබ වෙත උදාවනු ඇත. පළමු සැලසුම් වසර 3 සම්පූර්ණ වූ පසු, අත්‍යාවශ්‍ය අවස්ථාවකදී පමණක් ඔබට මෙම සැලසුම පවාරණය කර ඊට අදාළ පවාරණ අගය පවාරණ ගාස්තුවකට යටත්ව ලබාගත හැක. පවාරණය කිරීමකදී සැලසුම බලරහිත වනු ඇත.



# අමතර ප්‍රතිලාභ

## හදිසි අනතුරු ප්‍රතිලාභය

හදිසි අනතුරකින් සිදුවන වියෝවකදී ඔබේ යැපෙන්නන් හට මෙයින් වැඩි රැකවරණයක් හිමි වේ. එයට අමතරව ඔබට නිත්‍ය අකර්මණ්‍යතාවයකට මුහුණ දීමට සිදුවුවහොත් මූල්‍යමය රැකවරණය මෙයින් සැලසෙනු ඇත (සැලසෙන මූල්‍ය ප්‍රතිලාභයේ වටිනාකම අකර්මණ්‍යතාවයේ ස්වභාවය මත රඳා පවතී).

## රෝහල් ගතවීමේ ප්‍රතිලාභය

ඔබ දින තුනකට වඩා රෝහල් ගතව සිටියේනම්, සෑම දිනකටම (ඇතුළත් කළ දිනයේ සිටම) රු. 10,000 ක උපරිමයක් දක්වා මුදල් ලබාදෙයි. දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කළහොත් ලැබෙන එම මුදල දෙගුණවේ. මෙම ප්‍රතිලාභය ඔබේ කලත්‍රයා හා දරුවන් වෙනුවෙන්ද ලබාගත හැක.

## රෝහල් ගාස්තු ආවරණය

ඔබ සහ ඔබේ පවුලේ සාමාජිකයන් වෙත ශ්‍රී ලංකාව තුළ වැය වන වෛද්‍යමය වියදම් නැවත පියවාගත හැකි සෞඛ්‍යාරක්ෂණ ආවරණයකි. (මෙම ප්‍රතිලාභය වාරික ආරක්ෂණ ප්‍රතිලාභය මඟින් ආවරණය නොවේ).

## වැඩිහිටි සැත්කම් ප්‍රතිලාභය

ඔබ හා ඔබේ කලත්‍රයා වෙත ශ්‍රී ලංකාවේදී, ඉන්දියාවේදී හෝ සිංගප්පූරුවේදී ලැයිස්තුගත සැත්කම් 250 ක් සිදුකිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමි වේ.

## බරපතල රෝග ආවරණය

බරපතල රෝගාබාධ 22 කදී ඔබට හා ඔබගේ කලත්‍රයාට මූල්‍යමය ආධාර ලබාදෙයි. රුපියල් මිලියන 3ක උපරිමයක් දක්වා වූ ආවරණයක් ඔබට තෝරාගත හැකියි.

## ආදායම් ආරක්ෂණ ප්‍රතිලාභය

අනපේක්ෂිත අයුරින් ඔබගේ වියෝවකදී හෝ පූර්ණ නිත්‍ය අකර්මණ්‍යතාවයකදී ඔබේ යැපෙන්නන්හට වාරික ගෙවීමේ කාලසීමාව තුළදී වසර 10 ක උපරිමයකට යටත්ව මාසික ආදායමක් හිමි වේ.

## කලත්‍ර ජීවිත ආවරණය

මෙම සැලසුම තුළින් ඔබේ කලත්‍රයාට ද ජීවිත රැකවරණයක්.

## ළමා සෞඛ්‍යාරක්ෂණ ප්‍රතිලාභය

ඔබේ දරුවාට ශ්‍රී ලංකාවේදී, ඉන්දියාවේදී හෝ සිංගප්පූරුවේදී ලැයිස්තුගත සැත්කම් 250 ක් සිදුකිරීම සඳහා මෙමගින් මූල්‍ය සහය හිමි වේ. එයට අමතරව එමගින් රෝහල් ගතවීම සඳහා මුදල් ද, වයස අවුරුදු 12 ට අඩු දරුවකු සමග මව්පියන්ගෙන් අයෙකුට නැවතීමට සිදු වුවහොත් ඒ සඳහා විශේෂ දීමනාවක්ද පිරිනැමේ.

රක්ෂිතයා, රක්ෂණවරහිමියා නොවන අවස්ථාවකදී මෙම රක්ෂණ සැලසුමේ ප්‍රතිලාභ රක්ෂණවරහිමියාට අදාළ වන අතර, ආවරණයන් රක්ෂිතයා සඳහා අදාළ වේ.

මෙම පත්‍රිකාව රක්ෂණවරය පිළිබඳ සංක්ෂිප්තයකි. මෙම සැලසුම සම්බන්ධ සම්පූර්ණ විස්තර සඳහා කරුණාකර රක්ෂණ ඔප්පුව බලන්න.

EP - 300000151
V6 - 05/18

# AIA සමූහය පිළිබඳ

AIA සමූහය ආසියා ශාන්තිකර කලාපයෙහි විශිෂ්ටතම ජීවිත රක්‍ෂණ සේවා සම්පාදකයා වේ.



1919
චීනය

1931
හොංකොං

1931
සිංගප්පූරුව

1938
තායිලන්තය

1947
පිලිපීනය

1948
මැලේසියාව

1957
බෲනායි

1972
ඕස්ට්‍රේලියාව

1981
නවසීලන්තය

1982
මැකාවු

1984
ඉන්දුනීසියාව

1987
කොරියාව

1990
තායිවානය

2000
වියට්නාමය

2001
ඉන්දියාව

2012
ශ්‍රී ලංකාව

2013
මියන්මාරය *

2015
කාම්බෝජය

*මියන්මාරයේ ඇත්තේ AIA නියෝජිත කාර්යාලයකි.

**US$ ට්‍රිලියන 1 කට** වැඩි සමස්ත මූලික රක්ෂිත මුදලක්

ආසියාවේ **වසර 100 කට ආසන්න** සාඩම්බර ඉතිහාසයක්

**වෙළඳපළ 18 ක මෙහෙයුම්**

**මිලියන 30 කට** අධික තනි පුද්ගල රක්ෂණාවර

**මිලියන 16 කට** අධික සමූහ සැලසුම් සාමාජිකයින්

AIA Insurance Lanka PLC (Co.No.PQ 18) විසින් නිකුත් කරන ලදී. 05/2018

HEALTHIER, LONGER, BETTER LIVES

**AIA ඉන්ෂුවරන්ස් ලංකා PLC**
(Co.No.PQ 18)
AIA ටවර්, 92, ධර්මපාල මාවත, කොළඹ 07
ක්‍ෂණික ඇමතුම්: 011 2310310
ෆැක්ස්: 011 4715892
ඊ-මේල්: lk.info@aia.com